(නවවැනි පාර්ලිමේන්තුව - සිව්වැනි සභාවාරය)

අංක 1(5).]

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2023 මාර්තු 10 සිකුරාදා**

---

**2023 මාර්තු 21 අඟහරුවාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත යටතේ නියෝග,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(3) ව්‍යවස්ථාව සහ 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතේ 8(2) වගන්තිය සමඟ කියවිය යුතු 24 වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2022 නොවැම්බර් 29 දිනැති අංක 2308/08 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.03.07 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— සුබසාධක ප්‍රතිලාභ පනත යටතේ නියෝග,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(3) ව්‍යවස්ථාව සහ 2002 අංක 24 දරන සුබසාධක ප්‍රතිලාභ පනතේ 7(3), 8, 10, 11 සහ 12 වගන්ති සමඟ කියවිය යුතු 27 වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2022 දෙසැම්බර් 15 දිනැති අංක 2310/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.03.07 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝගය,— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 වගන්තිය යටතේ සෙස් බද්ද සංශෝධනය කිරීම සම්බන්ධයෙන් ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 නොවැම්බර් 14 දිනැති අංක 2306/15 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.03.08 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— රේගු ආඥාපනත යටතේ යෝජනා සම්මතය,— රේගු ආඥා පනතේ (235 අධිකාරය) 10 වගන්තිය යටතේ ආනයන තීරු බදු සම්බන්ධයෙන් 2023.03.08 දින ඉදිරිපත් කරන ලද යෝජනා සම්මතය අනුමත කළ යුතු ය.

(2023 ජනවාරි 01 දිනැති අංක 2312/75 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා,— සිවිල් ගුවන් සේවා පනත යටතේ නියෝග (අංක 1),— 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 6(3)(අ) සහ 31 වගන්ති සමඟ කියවිය යුතු 117(2)(ඩ) වගන්තිය යටතේ වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 ඔක්තෝබර් 26 දිනැති අංක 2303/18 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.03.07 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා,— සිවිල් ගුවන් සේවා පනත යටතේ නියෝග (අංක 2),— 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 117(2) සහ 117 (3) වගන්ති යටතේ වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 නොවැම්බර් 02 දිනැති අංක 2304/46 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.03.07 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා,— නීති අධ්‍යාපන සභා ආඥාපනත යටතේ රීති,— (276 අධිකාරය වූ) නීති අධ්‍යාපන සභා ආඥාපනතේ 7 වගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව සංස්ථාගත නීති අධ්‍යාපන සභාව විසින් සාදන ලදුව, 2020 දෙසැම්බර් 30 දිනැති අංක 2208/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.03.10 දින ඉදිරිපත් කරන ලද රීති අනුමත කළ යුතු ය.

*

විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා,— ඛනිජතෙල් සම්පත් පනත යටතේ නියෝග,— 2021 අංක 21 දරන ඛනිජතෙල් සම්පත් පනතේ 48 වගන්තිය යටතේ විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2023 ජනවාරි 05 දිනැති අංක 2313/47 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.03.07 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා සහ කර්මාන්ත අමාත්‍යතුමා,— ජාතික ශිල්ප සභාවේ වාර්ෂික වාර්තාව (2020),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3)වගන්තිය යටතේ 2022.11.28 දින ඉදිරිපත් කරන ලද, 2020.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික ශිල්ප සභාවේ 2020 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(කර්මාන්ත කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2023.01.20 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.02.21 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා සහ කර්මාන්ත අමාත්‍යතුමා,— කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් ආයතනයේ වාර්ෂික වාර්තාව (2017/2018),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3)වගන්තිය යටතේ 2023.01.18 දින ඉදිරිපත් කරන ලද, 2018.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් ආයතනයේ 2017/2018 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(කර්මාන්ත කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2023.01.20 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.02.21 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා සහ කර්මාන්ත අමාත්‍යතුමා,— කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් ආයතනයේ වාර්ෂික වාර්තාව (2018/2019),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2023.01.18 දින ඉදිරිපත් කරන ලද, 2019.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් ආයතනයේ 2018/2019 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(කර්මාන්ත කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2023.01.20 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.02.21 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

**2023 මාර්තු 22 බදාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

ශ්‍රී ලංකා මහ බැංකු පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2023 මාර්තු 23 බ්‍රහස්පතින්දා)**

1296/2023

ගරු අලි සබ්රි රහීම් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) විශ්‍රාම වැටුප් අංක 01-802666 හිමි එම්. නයිමුල්ලාහ් මහතාට, 2021.12.31 දිනැති සංශෝධිත විශ්‍රාම වැටුප් ප්‍රදාන පත්‍රයට අනුව හිමි විය යුතු මාසික විශ්‍රාම වැටුප රු. 31,833.33 ක් බව දන්නේද;

(ii) එසේ නම්, එම විශ්‍රාම වැටුප ඒ මහතාට අවසන් වරට ගෙවන ලද දිනය කවරේද;

(iii) එලෙස ගෙවා නොමැති නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් විසින් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් අමතන ලද අංක වි.වැ.ගි. 36/202 හා 2022.10.30 දිනැති ලිපියේ 3 වන ඡේදයේ සඳහන් පරිදි විශ්‍රාම වැටුප ලබා දීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග මේ වනතෙක් නොගැනීමට හේතු කවරේද;

(ii) හිඟ වැටුප් සහ දීමනා සමඟ ඉහත (අ)(i) හි සඳහන් විශ්‍රාම වැටුප නයිමුල්ලාහ් මහතාට ගෙවනු ලබන දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2023 අප්‍රේල් 04 අඟහරුවාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1/2023

ගරු චමින්ද විජේසිරි මහතා,— මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පසුගිය "යහපාලන රජය" පැවති අවදියේ ශ්‍රී ලංකා මහ බැංකුවේ බැඳුම්කර වංචාව සිදු වන අවස්ථාවේදී ශ්‍රී ලංකා මහ බැංකුව අයත්ව තිබූ අමාත්‍යාංශය කවරේද;

(ii) එම අවස්ථාවේදී ඉහත සඳහන් අමාත්‍යාංශය භාරව සිටි අමාත්‍යවරයාගේ නම සහ අමාත්‍යාංශ ලේකම්වරයාගේ නම වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම බැඳුම්කර වංචාව සම්බන්ධයෙන් මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

382/2023

ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා,— නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ නගර අලංකරණ වැඩසටහන යටතේ මේ වනවිට මහනුවර නගරයේ මාර්ග දෙපස පාරිසරික වටිනාකමකින් යුතු රුක් රෝපණය කර ඇති බව දන්නේද;

(ii) එම වැඩසටහන යටතේ මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රධාන නගරවල මාර්ග දෙපස ඇති පැරණි ගස් වෙනුවට පාරිසරික වටිනාකමකින් යුත් රුක් රෝපණය කිරීමට පියවර ගන්නේද;

(iii) එසේ නම්, ඉහත සඳහන් වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා මහනුවර දිස්ත්‍රික්කයේ සුදුසු නගර මේ වනවිට හඳුනාගෙන තිබේද;

(iv) එම නගර කවරේද;

(v) එම වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මහනුවර නගරයේ ඓතිහාසික වටිනාකමක් ඇති ස්ථානවල සහ පොදු ස්ථානවල නිරතුරුවම යාචකයන් ගැවසීම හේතුවෙන් නගරයේ අලංකාරයට සහ පවිත්‍රතාවයට අහිතකර බලපෑමක් සිදු වී ඇති බව දන්නේද;

(ii) එසේ නම්, එම යාචකයන් වෙනත් සුදුසු ස්ථානයකට යොමු කිරීම සඳහා පියවර ගන්නේද;

(iii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

416/2023

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකා පොලීසිය සතු නිල සුනඛයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පොලිස් නිල සුනඛයන්ගේ වර්ග කවරේද;

(iii) එම එක් එක් වර්ගය අනුව නිල සුනඛයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පොලිස් නිල සුනඛ කොට්ඨාසයට අනුයුක්ත කර ඇති නිලධාරීන් සංඛ්‍යාව;

(ii) වර්ෂ 2017 සිට 2021 දක්වා පොලිස් නිල සුනඛයන්ගේ ආධාරයෙන් අනාවරණය කරගන්නා ලද අපරාධ සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන්;

කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

431/2023

ගරු බුද්ධික පතිරණ මහතා,— බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහාචාර්ය, ආචාර්ය, කලා නිධි, විද්‍යා කීර්ති, විද්‍යා ජෝති, දේශ බන්දු, දේශ කීර්ති, දේශමාන්‍ය, විශ්ව කීර්ති සහ දේශ ශක්ති ආදී එක් එක් නම්බු නාම/ගෞරව නාම/පදවි පිරිනැමීමට බලය ඇති රාජ්‍ය ආයතනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම එක් එක් නම්බු නාමය/ගෞරව නාමය/පදවිය පිරිනැමීමේදී සළකා බලනු ලබන අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් නම්බු නාම/ගෞරව නාම/පදවිවලට අමතරව රජය විසින් පරිනමනු ලබන වෙනත් ගෞරව නාම/නම්බු නාම/පදවි තිබේද;

(iv) එසේ නම්, ඒවා පිරිනමනු ලබන ආයතන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නම්බු නාම/ගෞරව නාම/පදවි පිරිනමනු ලබන ශ්‍රී ලංකාවේ පෞද්ගලික ආයතන/සංවිධාන කවරේද;

(ii) එම එක් එක් ආයතනය/සංවිධානය විසින් පිරිනමනු ලබන නම්බු නාම/ගෞරව නාම/පදවි වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ආයතන/සංවිධාන නියාමනය කිරීම සඳහා රජයේ ක්‍රමවේදයක් තිබේද;

(iv) එසේ නම්, එම ක්‍රමවේද කවරේද;

(v) ගෞරව නාම/නම්බු නාම/පදවි පිරිනැමීමෙන් පසු එම පුද්ගලයන් සම්බන්ධයෙන් පසු විපරම් කිරීමේ ක්‍රමවේදයක් තිබේද;

(vi) එසේ නම්, එම ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

687/2023

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ වවුනතිව් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ගම්මානවල ජීවත් වන ජනතාව සඳහා 2018 වර්ෂයේදී නිවාස 44 ක් ලබා දුන් බවත්;

(ii) එහෙත්, මේ දක්වා එම නිවාසවල වැඩ කටයුතු සම්පූර්ණයෙන්ම අවසන් කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත නිවාසවල වැඩ කටයුතු සම්පූර්ණයෙන්ම අවසන් නොකිරීමට හේතු කවරේද;

(ii) එම නිවාසවල වැඩ කටයුතු අවසන් කිරීමට පියවර ගන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1798/2023

ගරු කුමාරසිරි රත්නායක මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මොනරාගල දිස්ත්‍රික්කයේ සියඹලාණ්ඩුව, මුතුකණ්ඩිය ජලාශය ඉදිකරන ලද දිනය කවරේද;

(ii) එම ජලාශය ඉදිකිරීම හේතුවෙන් එම ප්‍රදේශයේ තිබූ පැරණි ගම්මාන කිහිපයක ජීවත් වූ ජනතාවට සිය වාසභූමි අහිමි වූ බව දන්නේද;

(iii) එම ජනතාව සඳහා විකල්ප ඉඩම් හෝ වන්දි ලබා දී තිබේද;

(iv) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(v) ඔවුන්ට ලබා දෙන ලද වන්දි මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (ii)හි සඳහන් ජනතාව අතරින් කිසිදු වන්දි මුදලක් ලැබී නොමැති පුද්ගලයන් පිරිසක් සිටින බව දන්නේද;

(ii) එම පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඔවුන්ට වන්දි ලබා දීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, ඔවුන්ට වන්දි ලබා දෙනු ලබන දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1807/2023

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද M - 9 දුම්රිය එන්ජින් සංඛ්‍යාව කොපමණද;

(ii) එම දුම්රිය එන්ජින් ආනයනය කරන ලද වර්ෂය කවරේද;

(iii) ඒවා ආනයනය කරන ලද රට කවරේද;

(iv) ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i)හි සඳහන් දුම්රිය එන්ජින් අතරින් මේ වනවිට ධාවනය කරනු ලබන සහ ගාල් කර ඇති දුම්රිය එන්ජින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) අවශ්‍යතාවය අනුව පමණක් දුම්රිය එන්ජින් සහ දුම්රිය මැදිරි ආනයනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iii) මේ වනවිට ගාල් කර ඇති දුම්රිය එන්ජින් හා දුම්රිය මැදිරිවලින් යම් ප්‍රයෝජනයක් ගැනීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2527/2023

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් මෑත කාලයේ සිට නැගෙනහිර පළාතේ සිදු කරනු ලබන ඉඩම් අත්පත්කර ගැනීම් සම්බන්ධයෙන් දැනුම්වත් වී තිබේද;

(ii) සුළු ජාතීන් බහුල වශයෙන් පාරම්පරිකව ජීවත්වන ප්‍රදේශවල පමණක් එම අත්පත්කර ගැනීම් සිදු කිරීමේ අරමුණ කවරේද;

(iii) පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් අත්පත්කර ගනු ලබන ඉඩම් පරිපාලනය කිරීම සඳහා බෞද්ධ විහාර සහ භික්ෂූන් වහන්සේලා සම්බන්ධ කර ගැනීමේ අරමුණ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2572/2023

ගරු ඩී. වීරසිංහ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභී යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභීන් සංඛ්‍යාව කොපමණද;

(ii) වර්ෂ 2015 සිට මේ දක්වා ඔවුන්ට ගෙවා ඇති ප්‍රදාන මුදල කොපමණද;

(iii) වර්ෂ 2015 සිට මේ දක්වා ඉහත යෝජනා ක්‍රමයට බඳවාගෙන ඇති සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඉහත යෝජනා ක්‍රමයට සාමාජිකයන් බඳවාගැනීමට හා ඔවුන් දිරිගැන්වීමට විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්නේද;

(v) ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ අරමුදලෙහි මුදල් වෙනත් ආයෝජන ක්‍රමවල ආයෝජනය කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2619/2023

ගරු නීතිඥ මධුර විතානගේ මහතා,— බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා බුද්ධ ශාසන අරමුදලේ යම් අක්‍රමිකතාවයක්, අයථා පත්වීමක්, දූෂණ ක්‍රියාවක් හෝ නීති විරෝධී ක්‍රියාවක් සිදු වී තිබේද;

(ii) එසේ නම්, ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් එක් එක් කරුණ හේතුවෙන් රජයට අහිමි වී ඇති මූල්‍ය, දේපොළ හා මානව සම්පත්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් ක්‍රියා සඳහා වගකිව යුතු නිලධාරීන් හඳුනාගැනීමට විමර්ශන සිදු කර තිබේද;

(ii) වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන ඇත්නම්, ඔවුන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොමැති නම්, ඊට හේතු කවරේද;

(iv) ඉදිරියේදී ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගනු ලබන්නේද;

(v) ඉදිරියේදී සිදු විය හැකි මෙවැනි ක්‍රියා වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2023 අප්‍රේල් 06 බ්‍රහස්පතින්දා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

814/2023

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා,— වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවට අවශ්‍ය බිත්තර සංඛ්‍යාව දෛනිකව හා වාර්ෂිකව;

(ii) මේ වනවිට ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරනු ලබන බිත්තර සංඛ්‍යාව, දෛනිකව, මාසිකව හා වාර්ෂිකව;

(iii) මේ වනවිට ශ්‍රී ලංකාවේ බිත්තර හිඟයක් පවතින්නේ නම්, එම හිඟය දෛනිකව හා මාසිකව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) බිත්තර නිෂ්පාදන කර්මාන්තයේ නියැලී සිටින කුඩා, මධ්‍යම හා මහා පරිමාණයේ නිෂ්පාදකයන් සංඛ්‍යාව;

(ii) දෛනිකව බිත්තර 1000කට වැඩි, 10,000කට වැඩි හා 100,000කට වැඩි යන එක් එක් කාණ්ඩය යටතේ බිත්තර නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදකයන් සංඛ්‍යාව;

(iii) ඉහත (i)හි සඳහන් එක් එක් කාණ්ඩය යටතේ දිනකට නිෂ්පාදනය කරනු ලබන බිත්තර සංඛ්‍යාව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) බිත්තරයක් ආනයනය කිරීම සඳහා වැය වන මුදල කොපමණද;

(ii) පාරිභෝගිකයන් සඳහා එම ආනයනික බිත්තරයක් ලබා දිය හැකි මිල කොපමණද;

(iii) බිත්තර ඇතුළු ඇතැම් අත්‍යාවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය කූට ව්‍යාපාරිකයන් විසින් ඉහළ මිලකට විකුණන බව පිළිගන්නේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

831/2023

ගරු ඉම්තියාස් බාකීර් මාකර් මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 746-ඉදිරිලිගොඩ ග්‍රාම නිලධාරි වසමේ, පාසල් මාර්ගය කාපට් අතුරා සංවර්ධනය කිරීමේ මූලික කාර්යය බස්නාහිර පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියේ, කළුතර කාර්යාලය විසින් සිදු කරන ලද බවත්;

(ii) ඒ අනුව පළමු අදියර ලෙස ඉහත මාර්ගයේ කොන්ක්‍රීට් ගල් අතුරන ලද බවත්;

(iii) මේ වනවිට එම කොන්ක්‍රීට් ගල්, වර්ෂා ජලයට ගසාගෙන යාම හේතුවෙන් එම මාර්ගය අබලන් වී ගමනාගමනය සඳහා නුසුදුසු තත්ත්වයක පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත මාර්ගය කාපට් අතුරා සංවර්ධනය කිරීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම කටයුතු ආරම්භ කරනු ලබන දිනය කවරේද;

(iii) ඉහත ව්‍යාපෘතිය සඳහා වෙන් කරන ලද මුදල කොපමණද;

(iv) ඉහත අ(iii) හි සඳහන් කරුණ හේතුවෙන් මුදල් අපතේ යාමක් සිදු වී තිබේ නම්, ඊට වගකිව යුතු පුද්ගලයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

835/2023

ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා,— නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2016 සිට මේ දක්වා හඳුනාගෙන ඇති, කොළඹ දිස්ත්‍රික්කයේ අධි අවදානම් නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිවාසවල පදිංචිවී සිටින පවුල් අතරින් නැවත පදිංචි කිරීමේ වැඩසටහන යටතේ ප්‍රතිලාභ හිමි වූ පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) නැවත පදිංචි කිරීමේ වැඩසටහන යටතේ ඉහත සඳහන් අධි අවදානම් නිවාසවල පදිංචි වී සිටින පවුල් වෙනුවෙන් ප්‍රතිලාභ ලබා දීමේ ප්‍රමාදයක් පවතින බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

847/2023

ගරු ගාමිණී වලේබොඩ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2021 වර්ෂයේදී පනවන ලද රසායනික පොහොර තහනම හේතුවෙන් ශ්‍රී ලංකාවට සිදු වූ ආර්ථික බලපෑම ගණනය කර තිබේද;

(ii) එසේ නම්, වී, තේ, රබර්, කුරුඳු , පොල් සහ එළවළු ආදී එක් එක් භෝගයේ නිෂ්පාදනයේ සිදු වූ පහත වැටීම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) රසායනික පොහොර තහනම් කිරීම හේතුවෙන් ගොවීන් ගොවිතැන් කිරීමෙන් ඉවත් වී තිබේද;

(iv) එසේ නම්, එම ගොවීන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

858/2023

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2019 – 2022 කාලය තුළ රජය විසින් නියම කරන ලද කොවිඩ්-19 සඳහා වූ ඕඩ්ඩමාවඩි සුසාන භූමිය තුළ මිහිදන් කරන ලද කොවිඩ්-19 ආසාදිත මෘතදේහ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම සංඛ්‍යාව ඔවුන්ගේ වයස, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ජාතිය, ආගම සහ ජීවත් වූ පළාත/ දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) කොවිඩ්-19 ආසාදිත මරණ සඳහා සුසාන භූමියක් වශයෙන් රජය විසින් ඕඩ්ඩමාවඩි තෝරාගත් පදනම කවරේද;

(iv) කොවිඩ්-19 ආසාදිත මරණ සඳහා සුසාන භූමියක් වශයෙන් ඕඩ්ඩමාවඩි යොදාගත් පදනම සහ නිර්ණායක යොදාගනිමින් ඕඩ්ඩමාවඩි හැර වෙනත් ස්ථානයක්/ස්ථාන තෝරාගැනීමට රජය විසින් යම් කිසි උත්සාහයක් දරා තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහි ද?

(ආ) නොඑසේනම්, ඒ මන්ද?

866/2023

ගරු රෝහණ බංඩාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මිහින්තලේ ප්‍රාදේශීය සභාව විසින් නව වෙළඳ සංකීර්ණයක් ඉදිකර ඇති බව දන්නේද;

(ii) එසේ නම්, එම වෙළඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත වෙළඳ සංකීර්ණයේ ඉදිකර ඇති මුළු කඩකාමර සංඛ්‍යාව කොපමණද;

(ii) එම කඩකාමර බෙදා දීමේදී අක්‍රමිකාවයක් සිදු වී ඇති බව දන්නේද;

(iii) එසේ නම්, එය නිවැරදි කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1300/2023

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට විදුලිය විසන්ධි කිරීමක් සිදු කරනු ලබන බව දන්නේද;

(ii) එසේ නම්, විදුලිය විසන්ධි කරන වේලාව සහ ප්‍රදේශ තීරණය කිරීමේදී මේ වනවිට අනුගමනය කරනු ලබන තාක්ෂණික ක්‍රමවේදය කවරේද;

(iii) එම ක්‍රමවේදය සකස් කිරීමේදී සලකා බලන නිර්ණායක කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1302/2023

ගරු කිංස් නෙල්සන් මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) භාණ්ඩ ප්‍රවාහනය සඳහා මේ වනවිට යොදා තිබෙන දුම්රිය සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් දුම්රියේ ගමනාන්තය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) භාණ්ඩ ප්‍රවාහනය කිරීමට වැඩි වශයෙන් දුම්රිය යොදා ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1313/2023

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ප්‍රංශ රජයේ ණය ආධාර මත ක්‍රියාත්මක කරනු ලබන නැගෙනහිර පළාතේ, මුන්දෙනායි ආරු ගංගා ද්‍රෝණි ව්‍යාපෘතියේ සංවර්ධන කටයුතු යටතේ ජලාශ 02ක් ඉදිකිරීමට නියමිත බවත්;

(ii) එම ජලාශවල මැටි වේලි ඉදිකිරීම සඳහා විදේශීය උපදේශකයන්ගේ සහාය ලබා ගැනීමට ඉහත ව්‍යාපෘතියට ණය ආධාර ලබා දෙනු ලබන පාර්ශ්වයන් අපේක්ෂා කරන බවත්;

(iii) එහෙත්, විශේෂඥ දැනුමක් සහිත ඉංජිනේරුවන් මෙරට සිටින බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) විදේශීය උපදේශකයන්ගේ සේවය ලබා ගත යුතු බවට ණය ලබා දෙනු ලබන පාර්ශ්වයන් විසින් බලපෑම් කළේ ද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නැගෙනහිර පළාතේ, ගල්ඔය නවෝදය ව්‍යාපෘතියේ සියලුම අරමුදල් වැය කර ඇතත් මේ වනවිටත් යාන්ත්‍රික වැඩ කොටස් ඇතුළු සමහර වැඩ නිම කර නොමැති වීමෙන්, එම ව්‍යාපෘතියේ වැඩ සම්පූර්ණයෙන් අවසන් කර නොමැති බව දන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1318/2023

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කැලණි ගඟ ආශ්‍රිතව ස්ථාපිත කර ඇති කර්මාන්තශාලා සංඛ්‍යාව කොපමණද;

(ii) එම කර්මාන්තශාලාවලින් ඉවතලන අපවිත්‍ර ජලය එම ගඟට එක්කරනු ලබන බව දන්නේද;

(iii) එම අපවිත්‍ර ජලය හේතුවෙන් කැලණි ගං ජලයට සිදු වන හානිය සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදු කර තිබේද;

(iv) අපවිත්‍ර ජලය කැලණි ගඟට මුදා හැරීම වැළැක්වීම සඳහා මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

**2023 මැයි 12 සිකුරාදා**

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

පා. 2/2023

ගරු චමින්ද විජේසිරි මහතා,— රජයේ සියලු ආයතන රජය සතු ගොඩනැගිලිවල ස්ථානගත කිරීම,— මහජනතාවගේ බදු මුදලින් පවත්වාගෙන යනු ලබන රාජ්‍ය ආයතන පෞද්ගලික ගොඩනැගිලිවල ස්ථාපිත කිරීමෙන් විශාල මුදලක් අනවශ්‍ය ලෙස වියදම් වන හෙයින් ද, එම ආයතන, රාජ්‍ය ගොඩනැගිලි තුළ ස්ථාපිත කිරීමෙන් විශාල මුදලක් ඉතිරි කර ගැනීමට හැකි වන හෙයින් ද, සියලුම රාජ්‍ය ආයතන රජය සතු ගොඩනැගිලිවල පමණක් ස්ථාපිත කිරීමට රජය විසින් කටයුතු කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 3/2023

ගරු චමින්ද විජේසිරි මහතා,— කඩා වැටුණු මූල්‍ය ආයතන යළි නඟා සිටුවීම,— රටක ආර්ථික සංවර්ධනය හා මූල්‍ය වෙළඳපොළ කෙරෙහි සුවිශේෂී බලපෑමක් මූල්‍ය ආයතන හරහා සිදුවුවත්, පසුගිය කාලය පුරා මෙරට මූල්‍ය ආයතන කිහිපයක් කඩා වැටීමකට ලක් වී ඇති හෙයින් ද, එහි තැන්පතුකරුවන් පොදුවේ ප්‍රශ්න රාශියකට මුහුණ පා සිටින හෙයින් ද, එම මූල්‍ය ආයතන යළි නඟා සිටුවීම සඳහා කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 4/2023

ගරු චමින්ද විජේසිරි මහතා,— දේශීය ටින්මාළු නිෂ්පාදනය වැඩි කිරීම,— ශ්‍රී ලංකාව වටා මුහුද තිබියදී රටට අවශ්‍ය ටින්මාළු ආනයනය සඳහා වාර්ෂිකව විශාල මුදලක් විදේශ රටවල් කරා ඇදී යන හෙයින්, එම තත්ත්වය වැළැක්වීම සඳහා දේශීය ටින්මාළු කර්මාන්තය දියුණු කිරීමට කඩිනම් වැඩසටහනක් දියත් කිරීමට රජය කටයුතු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 5/2023

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් පාලන ආයතනවල කසළ බැහැර කිරීම,— ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන බොහොමයක් වර්තමානය වනවිට කසළ බැහැර කිරීමේ වගකීම පෞද්ගලික සමාගම් වෙත භාර දීම හේතුවෙන් බදු ගෙවන ජනතාවගේ විශාල මුදලක් අදාළ සමාගම් වෙත විතැන් වන හෙයින් එම කාර්යය අදාළ පළාත් පාලන ආයතනයේ සේවකයන් යොදවා සිදු කිරීමට අවශ්‍ය පියවර රජය විසින් ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 6/2023

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් පාලන ආයතනවල අබලන් වූ වාහන අලුත්වැඩියා කිරීම,— පළාත් පාලන ආයතන බොහොමයකම අබලන් තත්ත්වයේ පවතින වාහන ගාල් කර ඇති ආකාරය ඉතා සුලභ දසුනක් වන හෙයින් ද, එම ආයතන සඳහා අලුතින් වාහන මිල දී ගැනීම වෙනුවට එම වාහන අලුත්වැඩියා කිරීම තුළින් විශාල මුදලක් ඉතිරි කර ගත හැකි හෙයින් ද, පළාත් පාලන ආයතනවල අබලන් වී ඇති වාහන අලුත්වැඩියා කිරීමට කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 7/2023

ගරු චමින්ද විජේසිරි මහතා,— විදේශගත ශ්‍රමිකයන්ට සුබසාධනය සැලසීම,— ශ්‍රී ලංකාවට වැඩිම විදේශ විනිමය ලබාදීමට උරදෙන විදේශගත ශ්‍රමිකයින්ගේ පවුල්වල සුබසාධනය සඳහා කඩිනම් වැඩසටහනක් දියත් කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 8/2023

ගරු චමින්ද විජේසිරි මහතා,— මී පැණි කර්මාන්තය වැඩිදියුණු කිරීම,— ඉතා ඉහළ ඖෂධීය ගුණයෙන් යුතු, දේශීය හා විදේශීය වෙළෙඳපොළේ ඉහළ ඉල්ලුමක් ඇති මී පැණි කර්මාන්තය, දේශීය වශයෙන් වැඩිදියුණු කිරීමට කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 9/2023

ගරු බුද්ධික පතිරණ මහතා,— රාවණා රජු පිළිබඳ විධිමත් ගවේෂණයක් සිදු කිරීම,— රාවණා රජු පිළිබඳ නිශ්චිත ඉතිහාස තොරතුරු නොමැති වුවද, විධිමත් ගවේෂණයක් තුළින් ඔහු පිළිබඳ අප රටේ ආකල්ප නැංවීමටත්, රාවණා රජු සතුව තිබූ දැනුම රටේ අභිවෘද්ධිය සඳහා යොදා ගැනීමට හා ශ්‍රී ලාංකීය ඉතිහාසයේ සැඟවී ගිය පරිච්ඡේදයක් නිරාවරණය කර ගැනීමටත් හැකි වන බැවින්, විද්වත් කමිටුවක් හරහා රාවණා රජු පිළිබඳ ගවේෂණය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 10/2023

ගරු බුද්ධික පතිරණ මහතා,— දේශීය සහල් වර්ගයන්හි පෝෂ්‍ය ගුණය පිළිබඳ ජනතාව දැනුම්වත් කිරීම,— දැනට ශ්‍රී ලංකාවේ වෙළඳපොළ තුළ දක්නට ලැබෙන පැරණි දේශීය සහල් හා දැනට භාවිත කරන නව සහල් වර්ගයන්ගේ ඇති පෝෂ්‍ය ගුණය පිළිබඳව ද, විවිධ රෝගාබාධ ඇති අය භාවිත කළ යුතු සහල් වර්ග පිළිබඳව ජනතාව දැනුවත් කිරීම මෙන්ම, ගොවි ජනතාවට එම වී වර්ග වගා කිරීමට පහසුකම් සලසාදීම පිළිබඳව ද, රජය විසින් ජාතික මට්ටමේ වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 11/2023

ගරු බුද්ධික පතිරණ මහතා,— ආක්‍රමණික පැළෑටි හා සතුන් හේතුවෙන් ජෛව විවිධත්වයට සිදුවන හානිය අවම කිරීම,— ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වයට හානි විය හැකි ආක්‍රමණික පැළෑටි හා සතුන් හඳුනාගෙන, ඒවා නම්කිරීම මඟින් එම පැළෑටි හා සතුන් බෝ කිරීම හා ආනයනය කිරීම තහනම් කර ශ්‍රී ලංකාවේ පරිසරය ආරක්ෂා කිරීමට රජය මැදිහත් වී කඩිනමින් අවශ්‍ය නීති සම්පාදන කිරීමට අවශ්‍ය කටයුතු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 12/2023

ගරු බුද්ධික පතිරණ මහතා,— විශ්වවිද්‍යාල හා වෙනත් තෘතීයික අධ්‍යාපන ආයතනවල ශිෂ්‍ය/ ශිෂ්‍යාවන් විසින් කරනු ලබන පර්යේෂණ නිබන්ධන අදාළ අමාත්‍යාංශවල සංවර්ධන කටයුතු ඉලක්ක කරගනිමින් සකස් කිරීම,— ශ්‍රී ලංකාව තුළ දැනට පවතින විශ්වවිද්‍යාල හා වෙනත් තෘතීයික අධ්‍යාපන ආයතනවල අධ්‍යාපනය ලබන සිසුන් විසින් හදාරනු ලබන පාඨමාලා සම්බන්ධයෙන් සිදු කරනු ලබන පර්යේෂණ නිබන්ධන ශ්‍රී ලංකාවේ ආර්ථික, සමාජීය හා සංස්කෘතික වර්ධනයට අදාළව සිදු කිරීම වැදගත් වන හෙයින් ද, මෙම නිබන්ධන අධීක්ෂණය කරනු ලබන ආචාර්යවරුන් හා එකී පර්යේෂණ නිබන්ධනවලට

අදාළ අමාත්‍යාංශය අතර මනා සම්බන්ධීකරණයක් සිදු කිරීම සඳහා එක් එක් අමාත්‍යාංශ මට්ටමින් වගකිව යුතු නිලධාරියකු පත් කළ යුතු හෙයින් ද, අදාළ අමාත්‍යාංශයන් හි ඉදිරි සංවර්ධන ක්‍රියාදාමයන් සිදු කිරීමේ දී දිගුකාලීන, මධ්‍යකාලීන සහ කෙටිකාලීන ඉලක්ක සපුරා ගැනීම සඳහා එකී නිබන්ධන යොදා ගැනීමට ක්‍රමවත් වැඩපිළිවෙළක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.13/2023

ගරු බුද්ධික පතිරණ මහතා,— ලොව පුරා ඇති බෞද්ධ සිද්ධස්ථාන රැක ගැනීමට පෙරමුණ ගැනීම,— ලොව පුරා සිටින බෞද්ධයන්ගේ වන්දනාවට පාත්‍රවන බෞද්ධ සිද්ධස්ථානවල ආරක්ෂාව තර කිරීමට හා අන්තර්ජාතික වශයෙන් බෞද්ධයන් වෙනුවෙන් හඬක් නැඟිය හැකි ශක්තිමත් සංවිධානයක් ගොඩනැගීම සඳහා ලොව පුරා සිටින බෞද්ධ නායකයන් හා සංවිධාන ඒකරාශී කිරීමට ශ්‍රී ලංකාව මූලිකත්වය ගැනීම සඳහා සුදුසු වැඩපිළිවෙළක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 14/2023

ගරු බුද්ධික පතිරණ මහතා,— වැඩිහිටි නඩත්තු මණ්ඩල දිවයින පුරා ව්‍යාප්ත කිරීම,— ජීවිතයේ සැඳෑ සමය ගත කරමින් සිටින වැඩිහිටියන්ට තම පවුලේ සාමාජිකයන්ගෙන් මෙන්ම ඇතැම් ආයතනවලින් නොසලකා හැරීම් නිසා සිදුවන විවිධ අසාධාරණ සම්බන්ධයෙන් පැමිණිලි කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ, වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ මහලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක වන වැඩිහිටි නඩත්තු මණ්ඩල වැඩපිළිවෙළ පළාත්, දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ව්‍යාප්ත කිරීමට අවශ්‍ය පියවර රජය විසින් ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 15/2023

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලාංකික ආහාර සංස්කෘතිය පිළිබඳ ඉගෙනුම්, ඉගැන්වීම් ක්‍රියාවලියට බද්ධ කිරීම,— ශ්‍රී ලංකාවේ ආහාර කලාව, රසකාරක හා සංයෝග කිරීමේ කලාව, ආහාර පිසීමේ කලාව, වර්ණකාරක කලාව, ආහාර කැපීමේ කලාව ඇතුළු අංශ ගණනාවකින් සමන්විත වන බැවින්, ශ්‍රී ලාංකික ආහාර සංස්කෘතිය පිළිබඳ ඉගෙනුම්, ඉගැන්වීමේ ක්‍රමවේදයන් හරහා අනාගත පරපුරට පවරාදීම මඟින් දේශීය හා විදේශීය ජනතාව අතර අප රටේ ආහාර සංස්කෘතිය ව්‍යාප්ත කිරීමට මෙන්ම ශ්‍රී ලාංකීය අනන්‍යතාවය ලෝකය තුළ ඔසවා තැබීමට සුදුසු වැඩපිළිවෙළක් රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 16/2023

ගරු බුද්ධික පතිරණ මහතා,— අන්තර්ජාලය ඔස්සේ අළෙවි කිරීම මඟින් සිදු කරන ඖෂධ ජාවාරම මැඩපැවැත්වීම,— වර්තමානය වනවිට අන්තර්ජාලය ඔස්සේ ප්‍රමිතියකින් තොර ඖෂධ, වෛද්‍ය උපකරණ හා රූපලාවණ්‍ය නිෂ්පාදන විශාල ලෙස අළෙවි කරන බැවින් ද, මෙය අප රටේ ජනතාවගේ ජීවිතාරක්ෂාවට විශාල තර්ජනයක් වන බැවින් ද, මෙම තත්ත්වය මැඩපවත්වා ගැනීම සඳහා නිසි වැඩපිළිවෙළක් රජය විසින් සකසා ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 17/2023

ගරු බුද්ධික පතිරණ මහතා,— පාසල් දරුවන්ගේ වටිනාකම සමාජගත කිරීම,— පාසැල් දරුවන් නිරන්තරයෙන් ඇසුරු කරන දෙමාපියන්, ගුරුවරුන්, ක්‍රීඩා පුහුණුකරුවන්, පාසැල් වෑන් රථ රියැදුරන් ආදී පුද්ගලයන්හට දරුවන්ගේ වටිනාකම පිළිබඳ සමාජ විද්‍යාත්මක හා මනෝවිද්‍යාත්මක ක්‍රමවේද තුළින් සරලව පැහැදිලි කර රටේ හා සමාජයේ ඉදිරි යහපැවැත්ම වෙනුවෙන් දරුවන් සමාජ අභියෝග හමුවේ ආරක්ෂා කළ යුතු ආකාරය පිළිබඳ දැනුම්වත් කිරීමේ ජාතික මට්ටමේ වැඩසටහනක් රජය විසින් සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 18/2023

ගරු බුද්ධික පතිරණ මහතා,— ණය ක්‍රමයක් මඟින් වැඩිහිටි ප්‍රජාවගේ ආර්ථිකය ශක්තිමත් කිරීම,— වයස අවුරුදු 60 ඉක්මවා ඇති වැඩිහිටි ප්‍රජාවෙහි ජීවනෝපාය මාර්ග ශක්තිමත් කර දීමෙන් සමස්ත ශ්‍රී ලංකා ආර්ථිකයේ නිෂ්පාදනය වර්ධනය කිරීම සඳහා ඔවුන්ව දායක කර ගත හැකි වන හෙයින් ද, මෙම වැඩිහිටි ප්‍රජාව සඳහා බැංකු පද්ධතිය මඟින් ණය පහසුකම් ලබා නොදීම හේතුවෙන් ඔවුන්ට සමාජය තුළ වෙනස්ව සැලකීමක් සිදුවන හෙයින් ද, බැංකු පද්ධතිය මඟින් වයස අවුරුදු 60 ඉක්මවන්නන් හට ණය දීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම සඳහා යෝග්‍ය වැඩපිළිවෙළක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 19/2023

ගරු කිංස් නෙල්සන් මහතා,— සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් සවිබල ගැන්වීම,— ශ්‍රී ලංකාවේ සහල් මිල පාලනය කිරීමට හැකියාව ඇති සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් වර්තමානය වනවිට දුෂ්කරතා රැසකට මුහුණ දී සිටින බැවින්, එම ගැටලු විසඳීමට කඩිනමින් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.20/2023

ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා,— වගා හානි සිදු කරන රිලවුන් ගහනය පාලනය කිරීම,— ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික බෝගවලට වන සතුන්ගෙන් විශාල හානි සිදුවන හෙයින් ද, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ වාර්තා අනුව වන සතුන් හේතුවෙන් සිදුවන වගා හානිය වාර්ෂිකව 40% ක් පමණ එනම්, රුපියල් කෝටි 1800 ඉක්මවන හෙයින් ද, මේ අතරින් රිලවුන්ගෙන් කෘෂි වගාවන්ට සිදුවන හානි ක්‍රමයෙන් වර්ධනය වීම හේතුවෙන් මෙරට ගොවි ජනතාවට මෙන්ම රටේ ජාතික ආර්ථිකයට සෘජුවම බලපෑම් සිදුවන හෙයින් ද, ශ්‍රී ලංකාව බෞද්ධ මෙන්ම අවිහිංසාවාදී සංස්කෘතියකින් හෙබි රටක් වශයෙන් රිලවුන් විනාශ කිරීම මඟින් මෙම ගැටලුව විසඳීම අනුමත කළ නොහැකි හෙයින් ද, විද්‍යාත්මක ක්‍රමවේදයක් මඟින් රිලවුන් ගහනය පාලනය කිරීම සඳහා යෝග්‍ය වැඩසටහනක් රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.